




සිසිර දිසානායක

# කෙටියෙන් මහා නළුවක් ?

## (ස්කැට්ස් කෙටි නාට්‍යය උළෙල)

"මෙවර ස්කැට්ස් කෙටි නාට්‍ය උළෙල ඉතා ඉහළින් පැවැත්විණා." පන්හිඳ ලියවිල්ලකට මුල පිරුවා.

"පිරී ගිය රසික ප්‍රේක්ෂකාගාරයක් වෙනුවෙන් රස බර මෙන්ම හර බර කෙටි නාට්‍ය පහක් ඉදිරිපත් කළ උත්සවය කාගේත් කතා බහට ලක්වීම අරුමයක් නො වේ... දිනෙන් දින සිය අඩුපාඩු අවම කරගනිමින් ස්කැට්ස් ීක්ීී* සංවිධානය මේ ආ ගමන අප කාගේත් ප්‍රසාදයට ලක් වේ. අප අතරින් වියෝ වූ මාලිනී ජයසිංහ කලා හිතකාමී ගුරුමාතාවට උපහාර වශයෙන් ඇයගේ නමින් ඉදිරිපත් වන මෙම අංගය වේදිකා නාට්‍ය හිතකාමීන්ගේ රසාස්වාදය නැංවීමෙහිලාත්, නාට්‍යකරණයට උනන්දුවන හා එහි යෙදෙන නිර්මාණකරුවන්ගේ හා ශිල්පීන්ගේ දක්ෂතා ඔපනැංවීමෙහිලාත් මහෝපකාරී වේ. අප සමාජ උපකුලයට පමණක් සීමා නොවී අපගේ සංස්කෘතිකාංග තවනුවෙන් වේදිකාවේ ඉඩක් වෙන් කරගැනීමට කැපව කටයුතු කළ මාලිනී ජයසංහ මැතිණියට කරනා උතුම් ම වූ උපකාරයයි මේ. තාරුණ්‍යයට, නැවුම් අදහස-"වලට පිබිදෙන්නට නිදහස දී ඔවුන් හා අත්වැල් බඳගෙන කටයුතු කළ ඇයගේ අදහස් ඉදිරියටත් ගෙනයමින් මෙම උළෙල සඳහා මූලිකව කටයුතු කළ උපා උපදස, ඇයගේ ප්‍රිය සැමියාණන් වන ෂ්‍යාමන් ජයසිංහ යන මහත්වරුන් ඇතුළු සියළුම ස්කැට්ස් සංවිධානයේ සංවිධායකවරුන්ට මෙහිදී අපගේ කෘතඥතාවය හිමිවෙයි. මේ වසරේ සංවිධානයේ සභාපති ධුරන්දර දොන් උඩවත්ත සහෘදයාද මෙහිලා සිහිපත් කළයුතු වේ....."

"කෙටි නාට්‍ය උත්සවේ ගැන කෙටියෙන්ම ලියලා ඉවර කරන්නද කල්පනාව ?" පින්සල කොහේදෝ ඉඳලා එතෙන්ට පාත් වුණා.

"නෑ ලියනවා " ලියනවා. මං මේ අද අළුත් විදියකට ලියන්න හිතුවා. " කර්ටන් කෝල් එක", ස්තූති කතාව මුලින්ම....."

"ඒ කියන්නෙ පොතේ ගුරා එන්නෙ අන්තිමට ?" පැන්සල මේ කතාවට හවුල් වුණා.

"ඔව් ඉතින් මුළු උත්සවයම ගැන හිතුවොත් එදා එතන වුණොත් ඒකමනේ...." පන් උත්තර බැන්දා. " වෙන්නෙ මොනවද කියලා පොතේ ගුරා කතාව ඉදිරිපත් කරනවා වෙනුවට වුණේ මොනවද කියලා අගය කිරීමක් කළේ අන්තිමටනේ..... පන් අයෙමත් ලියන්න පටන් ගත්තා.

"නාට්‍ය පහ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳ දැනීමක් හා අත්දැකීම් සහිත ප්‍රවීණයින් දෙපළක් ලවා නිර්මාණ ඇගයීම මෙවර උළලේ තවත් විශේෂත්වයක් විය. ප්‍රවීණ නාට්‍ය නිර්මාණකරුවකු වන එස් කරුණාරත්න සහ ප්‍රවීණ රංගනවේදියකු වන ශ්‍රීනාත් මද්දුමගේ දෙපල ධනාත්මකව අදහස් දක්වමින් නිර්මාණ හා රංගන දායකත්වය දුන් පිරිස ධෛර්යමත් කළහ. එම අංගය මෙහෙයවනු ලැබුයේ ජගත් ජේ. එදිරිසිංහ සහෘදයා විසිනි.

නාලක වීරකෝන් සහෘදයා විසින් පුහුණු කර ඉදිරිපත් කළ වේදිකා නාට්‍ය ගීත ඒ ඒ කෙටි නාට්‍ය අතරතුරේදී ගායනා කරන ලද්දේ මින් පෙර වේදිකාවේ රංගනයෙන් හපන්කම් පෑ රත්නා ගුරුසිංහ සමඟ පුෂ්වා තිසේරා, හේමන්ත ඩයස් සහ නන්දන ඇතුලත්මුදලි ගායන ශිල්පි, ශිල්පිනියන් විසිනි. උත්සවය වඩාත් ආකර්ශනීය වූයේ නිම්නා රූපසිංහ යෞවන කලාකාරිය විසින් කදිම රංගනයක් සමඟින් නිවේදන කටයුතු කරමින් කළ ඉදිරිපත් කිරීම නිසාවෙනි....

"මතක ද අපි කිරුළපණෝ හන්දිටේ පොල් අතු ස්ටේජ් එකක වෙසක් නාට්ටියක රඟපෑවා ?" පින් ආයෙමත් පන්ගේ අවධානය බින්දා.

වෙසක් කාලයට පාරවල් අයිනෙ පොල් කොට හිටවල, ස්ටේජ් එකක් හදලා, පොල් අතුවලින් වහලයක් හදාගෙන වෙසක් බල්න්න පාරෙ යන අයට පේන්න නාට්ටි පෙන්නුවා ඒ දවස්වල. දෙබස් මුලින් "ටේප් " කරලා, "ලවුස් පීකරෙන් " ප්‍රචාරය කරනවා. ඒ විදියට තමයි නළු නිළියො රඟපාන්නෙ. ස්වර්නතිලකාගෙයි උද්දාල බ්‍රාහ්මණයගෙයි කතාවෙ උද්දාල බ්‍රාහ්මණයව විනාශ කරන ගෝලයින් තුන්දෙනාට තමයි අපේ අය රඟපෑවෙ. පින් හැම වෙලාවෙම රඟපෑවෙ පමා වෙලා. එයැයි රඟපාන කොට ඒ කොටසට කියවෙන දෙබස් ටික ගිහින් ඉවරයි. ගෑණු කෙනෙක්ගෙ මූණවත් බැලුවෙ නැති උද්දාල බමුණා ස්වාර්ණතිලකාට වශීවෙලා අන්තිමට ගෝලයින්ටත් උගන්නන එකත් මඟ අරිනවා. ඒකට් ගෝලයින් අතින් මැරුම් කන්නෙ. ඇත්තටම මේ චරිතයට ඇන්ද නළුවාත් ඒ වගේ කෙනෙක්. ඒත් අන්තිමට ස්වර්ණතිලකාට ඇන්ද නිළිය එක්ක යාලු වෙලා විවාහ වුණත් එක්ක. දැන් ඒ අෑයො රටෙත් නෑ....

කෙටි නාට්‍ය උළලේ මුලින්ම ඉදිරිපත් වූ නාට්‍යය වූයේ නෙළුම් ලියනගේ විසින් තිර නාටකය ලියා අධ්‍යක්ෂණය කළ, "පරතරය" නාට්‍යයයි. බ්‍රෙන්ට්වුඩ් සිංහල පාසැලේ ශිෂ්‍යයින්ගේ හා කාර්ය මණ්ඩලයේ දායකත්වයෙන් ඉදිරිපත් වූ මෙම නාට්‍යයේ තේමාව වන්නේ තරඟකාරී රැල්ලට හසු වූ දෙමාපියන් යුවලකි. ව්‍යාපාරිකයෙකු වූ සැම්සන්, වෘත්තිකයෙකු වූ බිරිඳත් අතර ඇතිවන මත ගැටුම් අනුසාරයෙන් තරඟකාරීත්වයත්, ඒ සමඟ තම දරුවන් ලවා තමන්ගේ අදහස් මුදුන්පත් කරවා ගැනීමට දරන යත්නයක් සාකච්ඡාවට ලක් වූ පිටපත් රචනයකි "පරතරය". අඹු " සැම් යුවලගේ මව ගේ චරිතය ද ඊට ඇතුලත් කරමින් පරම් පරා තුනක අදහස් " උදහස්, චර්යා රටාවන්, කතා බහ සංසන්දනයට ලක් කිරීම මෙහි අනෙක් විශේෂත්වයයි. රංගනයෙන් මෙන් ම අංග සෘචනයෙන් ද පරම්පරා තුනක වෙනස හුවා දැක් වූ අන්දම අගය කළ යුතුවේ.

දෙවන කෙටි නාට්‍ය වන "කලර්ඩ් විව්ස්" (Coloured Views) ඉදිරිපත් වූයේ ඉංග්‍රිසි මාධ්‍යයෙනි. නාතාෂා කුලරත්න යෞවන නිර්මාපකවරිය මෙහිදී සිය විශිෂ්ඨ හපන්කම් පෙන්වා ඇති බවයි අපගේ හැඟීම. මෙහි කථාවස්තුව හා පිටපත් රචනය ඇය සතුනම්, ඇයගේ පරිකල්පන ශක්තිය පිළිබඳව විශේෂ අගැයුමක් කළ යුතුව ඇත්තේය.

යෞවනයෙකු මවකගේ හා තරුණියකගෙන් ලබනා ආදරයේ වෙනස, තම තමන් එල්බගෙන සිටින මතය අනුව කටයුතු කිරීම වැනි සංකීර්ණ මනෝභාවයන් මෙවන් කෙටි කාලයකට ගොනු කිරීම ම ප්‍රබල අභියෝගයකි. එම මත වාද සංකේතවත් කරමින් " වර්ණ" රූපක වශයෙන් යොදා ගැනිමක් ඒ දේ ඉදිරිපත් කරන ආකාරයත් ප්‍රේක්ෂකයා අමන්දානන්දයට පත් කරයි. රතු ඇපල් ගෙඩිය දැක කලබල වන මව්ට වහාම ඇපල් ගෙඩිය ඉන් මතුවන සුදු පැහැය දක්වමින් යෞවනිය කියාපාන්නේ ඇතුලතින් තමා ද ඒ අදහස් ම දරනා බව ද ? මේ එක් නිදසුනක් පමණකි. එකිනොකට නොදෙවෙනි රංග වින්‍යාසයන්හි යෙදෙනා යෞවන ශිල්පි " ශිල්පිනීන් තිදෙනා පිළිබඳව වදනට කැටිකල නොහැකියි. කළු හා සුදු මූලික කරගත් වේදිකා පසුබිම ද, භාණ්ඩ ද, ඇඳුම් පැළඳුම් ද අතරට වදිනා රතු ඇඳුමින් සැරසුණ යුවතියද, ඇයගේ ඇඳුම් ආයිත්තම් ද නාට්‍යයේ මාතෘකාව අර්ථවත් කරන්නා සේ ම බටහිර සංස්කෘතියේ එන වර්ණ යොදාගැනෙන රටාව මොනවට නියෝජනය කරයි.

සිංහල ප්‍රේක්ෂකයින්ට එතරම් හුරු නොවූවති ඒක පුද්ගල නාට්‍ය කලාව. ශ්‍රී ලංකාවේදී හොඳම රංගනවේදියා ලෙසින් රාජ්‍ය නාට්‍ය උළලේ දී සම්මානයට පාත්‍ර වූ කණිෂ්ක ගයාන් රාජපක්ෂ රංගනය ඉක්මවා නිර්මාණ කරණයට අත ගැසූයේ මින් පෙර තමන්ගේ ම කෙටි නාට්‍ය පෙළක් ඉදිරිපත් කරමිනි. මෙවර කණිෂ්කගේ නිර්මාණය වූ "පුංචි රෝස මල" ඒක පුද්ගල කෙටි නාට්‍යයක් ලෙසින් වේදිකාගත කරමින් කණිෂ්ක තවත් පියවරක් ඉදිරියට තබන්නේ ය. නිදහසේ තමන්ට රිසි සේ මිය යන්නටවත් අවසරයක් නැති පෙම්වතුන් යුවලකගේ කතාව පොතේ ගුරු චරිතයකුත් සමඟින් ඔහු අප හට තිළිණ කරන්නේ එකී චරිත ත්‍රිත්වයම රඟපාමින් තමන් සතු කුසලතාවයන්ගෙන් සියල්ල තමන් නතු කරගනිමිනි. සමාජ යථාර්තය විවෘතව ඉදිරිපත් කිරීමේදී ඔහු නොබියව අවශ්‍ය අංග වේදිකාවට ගෙන එන්නේ සාම්ප්‍රදායික විවේචන පිළිබඳව අබ පියල්ලන් තරම්වත් නොතකමිනි.

සාම්ප්‍රදායික පොතේ ගුරු චරිතයෙන් මිදී ප්‍රේක්ෂකාගාරයෙන් වේදිකාවට කතාව කියවන්නා එළැඹෙන්නේ ප්‍රේක්ෂකයින් අතරින් මතු වූවකු ලෙසිනි. එස්. කරුණාරත්න නාට්‍ය වේදියාගේ නොමඳ පැසසුමට ලක් විය "පුංචි රෝස මල"

ඉන් ඉක්බිතිව ඉදිරිපත් වූයේ "එය මම සොයා ගත්තෙමි" කෙටි නාට්‍යයයි. මෙල්බර්න් පුරවරයෙන් ම ඉස්මතු වූ නාට්‍ය රංගන ශිල්පියෙකු හා නිර්මාණ කරුවකු ලෙසින් නන්දසිරි ද සිල්වා සහෘදයා පසුගියවර හොඳම නාට්‍යය සඳහා තිළින ලැබීය. සමාජයට පිළිලයක් වී ඇති දේ සමාජයෙන් තුරන් කිරීම, ඒ සඳහා විසඳුම් සොයා යාම, අවසන ඒ සියල්ල පටු දේශපාලන මතවාදවලින් ඉස්මතුවන අත්මාර්ථකාමය බලකාමය වැනි දුර්ගුණ අබිමුව විනාශ වී යාම නන්දසිරි ඉදිරිපත් කරන්නේ නිර්මාණශීලීවයි. ගමට රෝ බිය ගෙන දෙන "වෛරස් රාක්ෂයාත්", ඊට විසඳුම් සොයන වෙදමහත්මාත්, මුලාදෑනිවරුන් දෙපළත්, අනෙක් රංගන ශිල්පීන් පිරිසක් ඇසුරින් වේදිකාව මොහොතකට ගම්මානයක්, ගංගාවක් හා වෙද මැදුරක් බවට පත් කරනා අන්දම අපූරුයි. ගැමි බස් වහර අනාගන්තුකව භාවිතා කරනා අතර වැහැරීමේදී පවා ආගන්තුක බවක් නො දැනින. විශාල ශිල්පීන් පිරිසක් රංගනයෙන් දායක කරගත්ත ද ඒ සියල්ලන්ට ම තම හැකියාවක් දැක්වීමට ඉඩක් වෙන් වී තිබීම ද අගැයිය යුතු වන්නේය. වේදිකාලංකරණයේදී තාත්ත්විකත්වයට ළංවීමට වෙර දරමින් වේදිකාව මත මිනිසුන් ද රැගෙක පැදවෙන පාරුව, බෙහෙත් තෙල් කටාරම වැනි දේ සඳහා වෙනම ම ආයාසයක් ගෙන ඇත්තේය. දරුවන් ද එක් වූ මෙම නාට්‍යයේ සුදාර ද සිල්වා, රමේෂ් පුන්සර වැනි කුඩා දරුවන්ගේ රංගන හැකියාවන් ද, වෛරස් රාක්ෂයා ලෙස රඟ පෑ උදාරි ද සිල්වාගේ නර්ථන හැකියාවද, ඇලික්




**A.T. PARTNERS**
Accountants & Business Advisors Pty Ltd

**Online Tax Returns from $49***

1. Complete your tax information secuerly online by visiting **www.atpartners.com.au**
2. Your tax details will be reviewed & validated by a Registered Tax Agent
3. We will advise you on any additional tax detuctions that you can claim
4. We will act as your Registered Tax Agent regarding all ATO inquiries
5. Electronic lodgement & refund in less than 14 days

**Alternatively.......you can come to us ,**

**Get your Personal Tax Return done from $77***

Evening & Weekend appointments are available. * Conditions apply

**Other services we offer....**

- ✓ Tax Returns for Partnerships, Companies, SMSF's & Trusts
- ✓ Rental Property & Negative Gearing
- ✓ Tax Planning & Business Advise
- ✓ Administration & compliance of Self Managed Superannuation Funds
- ✓ New Business Registration & Company/Family Trust setups
- ✓ BAS, IAS, PAYG preparation & lodgement
- ✓ ASIC & ATO Liaison, Payment Plans & Amendments

*Please contact us to arrange your initial FREE consultation.*

*Achini : 0468 747 574* *email: info@atpartners.com.au*
*Tharanga : 0402 980 959* *web: www.atpartners.com.au*
*Office : 03 8768 8630*

AT Partners Accountants & Business Advisors Pty Ltd **ACN 150 795 716**
23 Tobin Way Lyndhurst VIC 3975